## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2016

---------------------------------------

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කරන හෝ අවසර දී ඇති විටකදී හැර වත්කම් හා බැරකම් හිලව් නොකල යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.149,256 ක්වූ ගෙවිය යුතු ශිෂ්‍යත්ව මුදලින් ශිෂ්‍යයින්ට වැඩිපුර ගෙවන ලද රු.21,076 ක් හා වැඩිපුර අයකරන ලද රු.24,200 ක් වූ උත්සව අත්තිකාරම් ලැබිය යුතු මුදල් වලින් අඩුකර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම රු.1,443,883 ක් වූ යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එම ප්‍රත්‍යාගණිත වටිනාකම 2016 වර්ෂයේදී යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට දේපල පිරියත හා උපකරණ යටතේ වූ වෙනත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් යන්ත්‍රෝපකරණ හා අනෙකුත් වත්කම්වලට අදාල ක්ෂය අනුපාතයන් එකිනෙකට වෙනස්වීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ක්ෂය සහ ශුද්ධ අගය දෝෂ සහිත විය.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පසුගිය වර්ෂය අවසානයට රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන එකතුව රු.2,918,722,000 ක් වූ අතර එම ප්‍රදාන උපයෝගීකර ගනිමින් අත්පත් කරගත් වත්කම් ක්ෂය කර තිබූ නමුත්, ලැබුණු රාජ්‍ය ප්‍රදාන ක්‍රමානුකූල පදනමකට වාර්ෂිකව ආදායම් ලෙස හඳුනා ගැනීම සඳහා ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි දේපල පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් අයත් වන දේපල පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද, නැනෝ තාක්ෂණ අංශය පිහිටුවීම සඳහා අත්පත් කර ගෙන තිබූ ඉඩමෙහි පිරිවැය රු.3,771,388 ක්වූ ඉදිකිරීම් ප්‍රත්‍යාගණනයෙන් අත්හැරී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් සඳහා 2016 වර්ෂයේ පලකරන ලද පුවත්පත් දැන්වීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.388,976 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් ජනිත වූ රු.1,603,075,230 ක්වූ ප්‍රත්‍යාගණන ලාභය රු.1,604,195,228 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සංචිත රු.1,119,998 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2013 වර්ෂය පදනම් කර ගෙන 2016 වර්ෂයේ දී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී, 2014 වර්ෂයේ සිට අදාල ක්ෂය සමුච්චිත අරමුදලට ගැලපීමේදී රු.840,002 ක් වැඩිපුර බැර කර තිබුණි.

(ඉ) 2013 වර්ෂය පදනම්ව 2016 වර්ෂයේදී මෝටර් රථ අගය ප්‍රත්‍යාගණනය කිරීමේදී 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය අගය රු.1,960,000 ක් අඩුවෙන් දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෝටර් රථ වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 හා 2016 වර්ෂවල පවත්වන ලද වයඹ ජාත්‍යන්තර සමුළුව **(Winc)** සඳහා ලැබී තිබූ මුදල ඉක්මවා විශ්වවිද්‍යාල අරමුදලින් දරන ලද එකතුව රු. 3,815,292 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදලක් ලෙස පෙන්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

වටිනාකම රු.408,276,027 ක් වූ ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් ඔප්පු/පැවරුම් නියෝග හා එකතුව රු.4,460,499,325 ක් වූ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ණයගැති සහ ලැබිය යුතු නේවාසිකාගාර ගාස්තු පිළිවෙලින් රු.39,194 ක් සහ රු.261,867 ක් වර්ෂ 12 ක් සහ වර්ෂ 06 ක කාල පරාසයක සිට හිඟව පැවතුණි.

(ආ) එකතුව රු.119,230 ක්වූ විශ්වවිද්‍යාලය කාර්ය මණ්ඩල ණය ශේෂ පහක් වර්ෂ 10 කාලයක සිට අයවීමකින් තොරව පවතින අතර, රු.41,000 ක අත්තිකාරම් මුදලක් වසර කීපයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම්වල දැක්වෙන වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර හා වර්ෂ දෙකකට වැඩි පිළිවෙලින් රු.16,924,506 ක් හා රු.401,446 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45 වගන්තිය හා 2005 ජූලි 15 දිනැති අංක 30 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාරයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව පාලක මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය බැංකුවක ස්ථාවර තැන්පත් ලෙස රු.7,000,000 ක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත | |
| (i) 99 (1) උපවගන්තිය | පීඨ මගින් පවත්වාගෙන යන ස්වයං පාඨමාලාවලට අදාලව ගිණුම් 22 ක 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.111,669,967 ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර විශ්වවිද්‍යාල මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගත යුතු වුවත්, එයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල වෙනත් බැරකම් යටතේ දක්වා තිබුණි. |
| (ii) 101 වගන්තිය | • විශ්වවිද්‍යාලයේ විවිධ පාඨමාලා වැඩසටහන් හා ව්‍යාපෘතීන් සඳහා ලබාදී තිබෙන පරිත්‍යාග එකතුව රු.1,061,501 ක් අරමුණුගත කාර්යයෙහි නොයොදවා වෙනත් පාඨමාලා, වැඩසටහන් සහ ව්‍යාපෘති වෙනුවෙන් වැය කර තිබුණි.<br><br>• ව්‍යාපෘතියක් අවසන් වූ පසු එයට අදාල බැංකු ගිණුම්වල ඉතිරි මුදල විශ්වවිද්‍යාල අරමුදලට මාරු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිමකර තිබුණු ව්‍යාපෘති 16 ක රු.3,463,006 ක ශුද්ධ අතිරික්ත මුදල ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද, විශ්වවිද්‍යාලයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත 2015 වර්ෂයේ ලබාදී තිබුණු රු.100,000 ක් වටිනා සැපයුම් හා විවිධ අත්තිකාරම් 2017 මාර්තු 10 දින වන විටත් පියවා නොතිබුණු අතර, 2016 වර්ෂයේ අවස්ථා 12 කදී ලබාදී තිබුණු රු.465,000 ක් වූ අත්තිකාරම් පියවීම ද මාසයකට වැඩි කාලයක් ප්‍රමාදවී තිබුණි. |

| | |
|---|---|
| (ii) මුදල් රෙගුලාසි 770 හා772 | දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් නොවන සහ භාවිතයට නොගන්නා රු.1,979,162 ක් වටිනා තොග අයිතම 66 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ගබඩාවල පැවති අතර, එම තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI / 2002 /02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2015 පෙබරවාරි 05 දිනැති අංක 02/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | 2014 සැප්තැම්බර් 10 දින සිට බල පැවැත්වෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීමේදී මෙම චක්‍රලේඛයේ රේටයන් අදාල කරගත යුතු වුවද, එයට පටහැනිව කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨයේ පවත්වා තිබුණු විනය පරීක්ෂණයක් වෙනුවෙන් එම පරීක්ෂණ නිලධාරියා විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුමක් පදනම් කරගෙන පරීක්ෂණය සඳහා රු.65,000 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

අරමුදලට අදාල අරමුණු හා කාර්යයන් පැහැදිලිව හඳුනා නොගෙන විශ්වවිද්‍යාලයේ අරමුදල් යොදවා සුභ සාධන අරමුදලක් පිහිටුවා තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට එහි ශේෂය රු.1,337,366 ක් විය. කෙසේ වුවද සුභසාධන අරමුදල පිහිටුවීමට අනුමැතිය ලබාගෙන තිබුණු බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 204,030,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 140,081,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවයෙහි රු.63,949,000 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. ස්ථාවර වත්කම් ක්ෂය රු.70,869,000 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවය වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඌනතාවය සියයට 25 ක අඩුවීමක් පෙන්නුම් කළද, 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඌනතාවයේ අඛණ්ඩ වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාලයේ 2012 වර්ෂයේ රු.298,963,000 ක්වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.698,384,000 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පීඨ 4 න් පීඨ දෙකක ඒක ශිෂ්‍ය පිරිවැය පසුගිය වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබූ අතර, පීඨ 02 ක ඒක ශිෂ්‍ය පිරිවැය වැඩිවී තිබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් පීඨ 2 හිම අධ්‍යයන වැටුප් වැඩිවීමද ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් ශිෂ්‍යාධාර වැඩිවීම හා ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීමද පශුසම්පත් ධීවර හා පෝෂණ විද්‍යාපීඨයේ රසායනික ද්‍රව්‍ය හා උපකරණ වියදම වැඩිවීමද බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයේ අධ්‍යයන කටයුතු සඳහා බඳවා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 1020 ක් වූ අතර, බඳවා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 840 ක් හා 938 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී පසුගිය වර්ෂයට සාපේක්ෂව බඳවා ගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ සියයට 10 ක අඩුවීමක් විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණේ පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යාපීඨයේ බඳවා ගැනීම් සියයට 27 කින් පහත වැටීම විය. මේ අනුව උපරිම ධාරිතාව උපයෝජනය කර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි.

(ඇ) ලෝක ශ්‍රේණිගත කිරීම් සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් (World Of Universities Ranking) අනුව 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාලය පිළිවෙලින් 5051 හා 07 වන ස්ථානයේ පැවති අතර, 2016 වර්ෂයේදී පිළිවෙලින් 5409 හා 10 වන ස්ථානය දක්වා පහත වැටී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) විශ්වවිද්‍යාලය මගින් අධික පිරිවැයක් දරමින් බිහි කරනු ලබන උපාධිධාරීන් සමාජගත වීම සහ කුමන ක්ෂේත්‍රවල රැකියාවන්ගේ නියුක්ත වී තිබේද යන්න පිළිබඳව පසු විපරම් සමීක්ෂණ මඟින් තොරතුරු ලබාගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාකඳුර පරිශ්‍රයේ අක්කර 5 කින් යුතු මහයාය වත්ත පොල් ඉඩම මිලදී ගැනීම සඳහා 2013 ජූලි 10 දින රු.මිලියන 10 ක් පොල් පර්යේෂණ ආයතනය වෙත ගෙවා තිබුණු අතර, ඒ සඳහා විකුණුම් කර ඔප්පුවක් ලබාගෙන නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ දී රු.3,835,000 කට තක්සේරු කරන ලද පර්චස් 711 ක් වූ කුඹුරු ඉඩම් කොටස් 08 ක් පවරා ගැනීම සඳහා රු.1,013,750 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇතත් අදාල කුඹුරු ඉඩම් පවරාගැනීමේ කටයුතු නිමකර නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

2016 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ කාලය අවසන් වී තිබුණු නමුත් 2017 මාර්තු 20 දින වන විටත් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකළ හා පර්යේෂණ කාර්යයන් අතර මඟ නවතා දමා තිබුණු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 07 දෙනෙක් වෙත 2014, 2015 සහ 2016 වර්ෂවලදී පර්යේෂණ දීමනා ලෙස ගෙවා තිබුණු රු.2,417,815 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 217 ක් හා තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 176 ක් වීමෙන් ස්ථිර කාර්ය මණ්ඩලයේ 41 දෙනෙකු පුරප්පාඩු වී තිබූ අතර අනුමත ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය 414 ක් හා තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය 369 ක් වීමෙන් අනධ්‍යයන ස්ථිර කාර්ය මණ්ඩලයේ 45 ක් වූ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව විශ්වවිද්‍යාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුලත්ව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 46 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර, වැය විෂයයන් 30 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. එහෙයින් විශ්වවිද්‍යාලය විසින් වාර්ෂික අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇති බව නිරීක්ෂණය නොවීය.

(ආ) විශ්වවිද්‍යාලයේ ආරම්භ කිරීමට යෝජිත වෛද්‍ය පීඨයේ මූලික වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබියදී රු.4,090,837 ක මුදලක් වැය කර තිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව විශ්වවිද්‍යාලයේ 2014 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| | ---------------------------- | -------------- |
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් නිම කරවා ගැනීමට කටයුතු නොකිරීම හා ඉදිකිරීම්වලට අදාලව නිම කරන ලද වැඩවල වටිනාකම් සඳහා බිල්පත් කඩිනමින් ලබාගෙන නිරවුල් කිරීමට හා වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන අංශයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකිරීම නිසා බාහිර දේශකයින්ගේ සහාය ලබාගැනීම හේතුවෙන් විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබීම. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | එක් එක් පීඨ සඳහා බඳවා ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගෙන නොතිබීම. |
| (ඉ) | අයවැය පාලනය | ලැබී තිබෙන ප්‍රතිපාදන උපයෝජනය කරන ආකාරය දැක්වෙන පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබීම. |
| (ඊ) | අභ්‍යන්තර විගණනය | නිවැරදි මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු, වැඩ යෝජනා ක්‍රම හා ව්‍යාපෘති යන මේවායේ ප්‍රගතිය සොයා බැලීම සිදුකර නොතිබීම. |